**වර්ෂ 2022 ක් වූ මාර්තු මස 24 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා |
| 02. ගරු උප සභාපති | - | එච්.ඒ නන්දසෝම මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | වී.මුරලිදරන් මහතා |
| 04. ගරු මන්ත්‍රී | - | ශාන්තලාල් පෙරේරා මහතා |
| 05. ගරු මන්ත්‍රී | - | ජී.කේ.පී ෆොන්සේකා මිය |
| 06. ගරු මන්ත්‍රී | - | ටී.ඒ.ඩී.සී දමයන්ති මිය |
| 07. ගරු මන්ත්‍රී | - | එච්.ජී මෛත්‍රීපාල මහතා |
| 08. ගරු මන්ත්‍රී | - | එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය |
| 09. ගරු මන්ත්‍රී | - | අයි.රාමකිලි මහතා |
| 10. ගරු මන්ත්‍රී | - | ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා |
| 11. ගරු මන්ත්‍රී | - | කේ.ඕ කුසුම්ලතා මිය |
| 12. ගරු මන්ත්‍රී | - | එස්.එල්.අරුණ ශාන්ත මහතා |
| 13. ගරු මන්ත්‍රී | - | එන්.එම් සුසිලා දමයන්ති මිය |
| 14. ගරු මන්ත්‍රී | - | එච්.ජී මහින්ද ගුණසේකර මහතා |
| 15. ගරු මන්ත්‍රී | - | එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා |
| 16. ගරු මන්ත්‍රී | - | එච්.ඒ.එන්.සී රණසිංහ මහතා |
| 17. ගරු මන්ත්‍රී | - | පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි |

නොපැමිණීම

| | | |
|---|---|---|
| 01. ගරු මන්ත්‍රී | - | ජී.එස්.ඒ ෆොන්සේකා මහතා |
| 02. ගරු මන්ත්‍රී | - | කේ.ඕ.සෝමතිලක මහතා |
| 03. ගරු මන්ත්‍රී | - | එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා |

**01. පසුගිය මහා සභා වාර්තාව හා අයවැය සම්මත කිරිමේ වාර්තාව සහා සම්මත කිරිම**

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

මං හිතනවා සභා වාර්තාව ලේකම්තුමිය අත්සන් කරලා දුන්නොත් හොඳයි කියලා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

සභාව ඉවර උනාට පස්සේ තමයි අත්සන් කරන්න ඕනි.එතකොට තමයි ඒක නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත් වෙන්නේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

ව්‍යාපෘති වලට මුදල් වෙන් කිරිම ගැන ස්ථාන කීපයකම සදහන් වෙලා තියෙනවා සභා වාර්තාවේ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

අපෙන් අනුමැතිය සදහා යවන ලියුම් එක් එක් ස්ථාන වලට යවද්දී ඒ ස්ථාන වලින් ඒ ලියුම ඉදිරියට යවනවා කියන්න අපිට පිටපත් රාශියක් එවනවා.ඒ ලියුම් තමයි නිවේදන යටතේ සදහන් වෙන්නේ.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා

ගරු ලේකම්තුමියගෙන් මං අහන්න කැමතියි කොයි දිනයේද 2022 අයවැය ලේඛනයක් සම්මත උනේ කියලා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ඒක ඔබතුමාට පසුව විස්තර ඉදිරිපත් කරන්නම්.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
2022 පෙබරවාරි මස 24 වන දින මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 පෙබරවාරි මස 24 වන දින මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ගම සමග පිළිසඳරක් 2022 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පස්බාගේ කෝරළේ - පොදු යටිතල පහසුකම් සංවර්ධන ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 සහකාර ඉඩම් කොමසාරිස්,ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,රජමල්වත්ත පාර,බත්තරමුල්ල
ගෝනාවලපතන සුසාන භූමිය පවත්වා ගෙන යාම සඳහා ඉඩම් කොටසක් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත පැවරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 ලේකම්,ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
නාවලපිටිය වැලිගම්පල ශ්‍රී ඉසිපතනාරාම විහාරස්ථානයේ විහාරගෙයි අබලන්ව ඇති වහලය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු:73260.00 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 අධ්‍යක්ෂ,මධ්‍යම පරිසර අධිකාරිය,පොල්ගොල්ල
පාරිසරික ආරක්ෂණ බලපත්‍රය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
පොලිතින් ආහාර ඇසුරුම් (ලන්ච් ෂීට්) භාවිතයෙන් බැහැර වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ
ප්‍රාදේශීය සෞඛ්‍ය කමිටු වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බව්වාගම සිරි ධම්මරථන පිරිවෙන් විහාරස්ථානයේ ධර්ම ශාලාවේ ජනෙල් ග්‍රීල් සවි කිරීම වෙනුවෙන් රු:122,034.90 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 09 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බච්චාගම සිරි ධම්මරථන පිරිවෙන් විහාරස්ථානයේ ධර්ම ශාලාවේ ජනෙල් ග්‍රීල් සවි කිරිම වෙනුවෙන් රු:122,034.90 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 10 ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බච්චාගම ඉඹුල්පිටිය මරණාධාර සමිතිය සඳහා ශබ්ද විකාශන යන්ත්‍රයක් ලබා දීම වෙනුවෙන් රු:45900.00 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 11 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය ,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය බච්චාගම සිරි ධම්මරථන පිරිවෙන් විහාරස්ථානයේ ධර්ම ශාලාවේ ජනෙල් ග්‍රීල් සවි කිරිම වෙනුවෙන් රු:122034.90 ක මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 12 ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය හෝල්ගම ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ආවාසයේ ඉහළ මහල සංවර්ධනය කිරිම වෙනුවෙන් රු:122646.16 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 13 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය හෝල්ගම ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ ආවාසයේ ඉහළ මහල සංවර්ධනය කිරිම වෙනුවෙන් රු:122646.16 මුදලක් සභා අරමුදලින් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 14 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 15 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ</u>

විමර්ශන වාර්තාව - ගෙවීම් වවුචර් පරික්ෂාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 16 Board Of Investment Of Sri Lanka,Colombo 01</u>

Renewel Of Environmental Protection Licence යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 17 ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පස්බාගේ කෝරළේ,නාවලපිටිය</u>

වැලිගොඩවත්ත ෂෙම්රොක් ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාවට පැවරීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා දීර්ඝ කාලීන බදු ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 18 මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,මහනුවර</u>

රටේ පවතින විදුලි අර්බුදය හමුවේ විදුලිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරිම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 19 නියෝජ්‍ය අධ්‍යක්ෂිකා,දේශීය ණය හා සංවර්ධන අරමුදල,24ඒ,වෝඩ් පෙදෙස,කොළඹ 07</u>

ප්‍රාදේශීය සභා ඉහළ මහල උත්සව හා සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස සංවර්ධනය කිරිම සඳහා වූ ණය මුදල යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

<u>02 - 20 ජනක බණ්ඩාර තෙන්නකෝන්,රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය ,කොළඹ 07</u>

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහල මහල ඉදි කිරිම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 21 පළාත් පාලන සහකාර කොමසාරිස්,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
තාක්ෂණ නිලධාරි තනතුරේ සේවය ලබා ගැනීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 22 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
දේපල සංවර්ධනකරුවන් සඳහා CIDA ලියාපදිංචිය ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස හඳුන්වා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 23 සභාපති,මාර්ග සංවර්ධන අධිකාරිය,බෝගම්බර,මහනුවර
මධ්‍යම පළාත තුළ ග්‍රාමීය මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම - 2022 යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 24 අධ්‍යක්ෂ,දිස්ත්‍රික් මහ රෝහල,නාවලපිටිය
ස්තුතිය පළ කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 25 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ
1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පළාත් සභා හා රේඛීය අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘති 2022.03.23 දිනට ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 27 සභාපති,ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,බත්තරමුල්ල
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 28 සභාපති,ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,බත්තරමුල්ල
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරීම**

03 - 01 ප්‍රදේශවාසීන්,ඩියුරස්බර්ග් වත්ත,අළුත්ගම,දෙකිද,නාවලපිටිය
වැලිගම්පොල ඉසදීන් සිට අළුත්ගම මැද මාර්ගය සාදා දෙන ලෙස ඉල්ලීමයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැවේගම ජල මාර්ගයේ වැල් පෙට්ටිය සකස් කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.
සිමෙන්ති මිටි 03
10 කම්බි 06
වැලි තාච්චි 40
මැටල් තාච්චි 50
බයින්ඩින් ග්‍රෑම් 250
ඇණ ග්‍රෑම් 500
දන්වැල් අඩි 06

ඉබ් යතුරු 01
අභල් 02 බට 07

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>
දැනට ඔය ඔක්කොම බඩු නැතත් වැල් 2 දුන්නත් කමක් නෑ.එක දවසකට එක පැත්තකටයි අනිත් දවසේ අනිත් පැත්තටයි දුන්නනම් හරි.මං ලේකම්තුමියටත් අහන්න දුන්නා ලොකු රණ්ඩුවක් වෙන්න ගියා.එක ගෙදරට වැල් 3 ගානේ දාලා තියෙනවා.ඒක හරි අසාධාරණයි.අපිට වතුර බින්දුවක් වත් නෑ.සභාවේ ඉන්නවා කියන්නත් ලැජ්ජයි.තෝමස් නම් හරියට වැඩේ කරනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
ලොකුම ගැටලුව හැමෝම ඇනිකට් එකට එන එක.තෝමස්ට විතරක් වැඩේ කරන්න දුන්නා නම් හරියට කරනවා.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>
මං යෝජනා කරලා කලින් තෝමස් එක්ක එකතු වෙලා වැල් පෙට්ටිය හැදුවා.අභල් 2 බටයකින් ඇවිත් 4 ½ බටයකින් යන එක මදි නිසා අපි රෑ 9 ට වතුර එක වැහුවා.ළඟ ගෙදරක් වතුර බිලෙනුත් නිදහස් කරා.10 විතර පස්සේ වතුර නෑ කිව්වම අපි දවසක් හැර දවසක් වතුර දෙන්න කටයුතු කළා.නමුත් ගෙවල් වල ටැංකි නැති නිසා ගැටලුවක් උනා.මං ඒ අයට උපදෙස් දුන්නා ගෙදර ටැංකියක් හදාගන්න කියලා.වතුර එන්නේ නැති පැත්තේ අය ගිහින් වැල් එක කඩනවා.වතුර බට දුන්නත් වැඩක් නෑ මිනිස්සු දැනුවත් කරන්නේ නැතුව.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
නීතිය ක්‍රියාත්මක කරන්න තමයි තියෙන්නේ.රඹුක්පිටිය පාසලේ ලොකු වතුර ගැටලුවක් තියෙනවා.ඒ වගේම බලංතොට උතුර ප්‍රජා මූල සංවිධානය ක්‍රියාත්මක වෙන්නේ නැති තත්ත්වයක් තමයි තියෙන්නේ.සැලසුම් සහගතව වතුර බෙදා දීමේ හැකියාවක් තියෙනවා තවම.ලෙව්දෙණිය කියන කොටසට යන ලයින් එක වහලා.එයාලා සංවිධානයට ලොකු දායකත්වයක් ලබා දුන් පිරිසක්.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
බලංතොට උතුර ගැටලු තිබුණු නිසා තමයි ඔය තත්ත්වයට පත් වෙලා තියෙන්නේ.දැනට ජල උල්පත් හිදිලා තියෙන්නේ.ගිය සතියෙත් මං ගියා ජල මූලාශ්‍රය බලන්න.නිසි නඩත්තුවක් වෙලා නෑ.පසුගිය කාලයේ රැස්වීමක් තියාගන්නත් බැරි උනා.මේ වර්ෂයේ මගේ ප්‍රතිපාදන වලින් ලක්ෂ 2 ½ වෙන් කරලා තියෙනවා ජල මූලාශ්‍රය වටේට වැට ගහන්න.පිල්ටර් ටැංකිය සම්පූර්ණයෙන්ම නවීකරණය කරන්න ඒ කාලයේ මුදල් ආවට ඒ වැඩේ කරලා නෑ.ගොනුවේ බිල් තියෙනවා වැඩේ කරා කියලා.මුදල් වලට උන දෙයක් නෑ.මේ අවුරුද්දේ මට වෙන් උන මුදලින් ලක්ෂ 3 කුත් මං වෙන් කරලා තියෙනවා ඒ පිල්ටර් ටැංකිය නවීකරණය කරන්න.එතකොට ජල ගැටලුව 100% විසඳෙනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
රන්දිය ප්‍රජා මූල සංවිධානයේ මං හිටපු සභාපතිතුමා.සංවිධානයට මුදල් ආවේ නෑ.මීට කලිනුත් ඔබතුමා කිව්වා සමිතියේ මුදල් වංචා වෙලා තියෙනවා කියලා.ඔබතුමා හිතනවා නම් වංචාවක් උනා කියලා ඒකට විමර්ශනයක් කරන්න.ලක්ෂ 7ක් රන්දිය ප්‍රජා මූල සංවිධානය කියලා ආවා.ඉල්ලීම කරලා තිබුනේ පොම්පීය ජල යෝජනා ක්‍රමයකට යන්න දෙන්න කියලා.නමුත් ලක්ෂ 7 ආවේ පිල්ටර් ටැංකිය ශුද්ධ කරන්න.පිල්ටර් ටැංකිය ශුද්ධ කරන්න දෙයක් නෑ.මං කථා කලාම ඒක ඇවිත් තියෙන්නේ අනුරාධපුර රන්දිය ප්‍රජා මූල සංවිධානයට.මං තිබුණ පිල්ටර් ටැංකිය ශුද්ධ කරා.මාස 3 කින් ලියුමක්

එවනවා ඒ සල්ලි ටික එහෙට යවන්න කියලා.නමුත් ගමේ ප්‍රචාරය යවනවා වංචා කරා කියලා.ඇනිකට් එක හොයාගත්තේ මාත් එක්ක තව කීප දෙනෙක්.ප්‍රධාන පාර හදනකොට බට හම්බ උනා.ඒකෙන් තමයි මේ වැඩේ පටන් ගත්තේ.අපි පටන් අරන් හොදට කරපු දේ දැන් අයාලේ යනවා.උප සභාපතිතුමත් හොරෙන්නේ වතුර අරන් තියෙන්නේ.ඔබතුමා ඒක පිළිගන්නේ නෑ.අපිට දුන්නොත් අපි හොදට වතුර දිලා පෙන්නනන්නම්.මීට වඩා පැවිල්ලට අපි වතුර දුන්නා.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
අවුරුදු 11ක් තිස්සේ එකතු කරපු සල්ලි නෑ සමිතියේ.ඔබතුමා නම් අවුරුදු 2 ක් නේ හිටියේ.ජල ව්‍යාපෘතිය ආරක්ෂා කරන වැඩසටහන් මං කරලා තියෙනවා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
වංචාවක් වෙලා තියෙනවා නම් පරික්ෂණයක් කරන්න.අපිට නින්දා විදින්න ඕනි නෑ.අපි කැපකිරිම් කරා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභාවෙන් තමයි කලින් හැමදේම පාලනය කරේ.අපේ බලය පස්සේ ප්‍රජා මූල සංවිධානය ගත්තා.සිරිසේන මන්ත්‍රීතුමා පෞද්ගලිකව චෝදනාව සම්බන්ධව ඉදිරි පියවර ගන්න.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ලිඛිතව දැනුවත් කරලා තියෙනවා.කාර්යාලයේ නිලධාරිතුමියක් එක්ක ගැටලුවකුත් උනා.එක දවසක් ගිහින් මං අත්සන් කරලා ආවම ආයෙත් දවසක් එන්න කිව්වා.මං ඒත් ගියා.ව්‍යාපෘතිය පටන් ගන්නද කියලා ඇහුවමත් පටන් ගන්න කිව්වා.ඊට පස්සේ ලියුමක් එවනවා ඒ සල්ලි ආයේ එවන්න කියලා.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව තාක්ෂණ නිලධාරි වාර්තාව ලබා ගෙන ඒ අනුව ද්‍රව්‍ය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රාදේශීය සභාවේ පරිසර හා පොදු පහසුකම් කමිටුවේ යෝජනාවක් අනුව බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් හට පහත සදහන් පුහුණු වැඩසටහන් පැවැත්වීම සුදුසු බවට මම යෝජනා කරමි.

| නම | යෝජිත පුහුණුලාභීන් ගණන | පුහුණු ස්ථානය |
|---|---|---|
| බිහු පාලනය | 25 | ඔගස්ටාවත්ත පේරාදෙණිය |
| ඕකිඩ් වගාව | 50 | උද්භිත උද්‍යානය පේරාදෙණිය |
| ඇන්තූරියම් වගාව | 50 | උද්භිත උද්‍යානය පේරාදෙණිය |
| විසිතුරු පත්‍ර වගාව | 50 | උද්භිත උද්‍යානය පේරාදෙණිය |
| කාබනික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන | 25 | කෘෂි උද්‍යානය ගන්නොරුව |
| ආහාර තාක්ෂණය | 20 | ආහාර තාක්ෂණ අංශය,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| අවුරුදු නැකතට පැළයක් සිටුවමු වැඩසටහන | | |

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සදහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පරිසර නිලධාරි විසින් දඩුබැදිරුප්ප අතුරු මාර්ගයේ මාර්ග ගැටලුවක් සම්බන්ධව සිදු කරන ලද ස්ථානීය පරික්ෂාව අනුව ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා.එම වාර්තාව අනුව වැලිගොඩවත්ත හන්දියේ සිට දඩුබැදිරුප්ප මාර්ගයේ අතුරු පාරක් වන දඩුබැදිරුප්ප අතුරු මාර්ගය ගැසට් කර සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
රඹුක්පිටිය මහජන පුස්තකාලයෙන් ජංගම පුස්තකාල සේවා කටයුතු වැඩිදුරටත් ක්‍රියාත්මක කිරිම සඳහා ලංගම බස් රථයක් ලබා ගැනීම සඳහා සකස් කළ ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් එම ව්‍යාපෘති වාර්තාව සමග බස් රථයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කිරිම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 වර්ෂයේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් අනුමත කරනු ලැබූ අයවැය යෝජනාවට අනුව 605 – 9 - ඃ ශීර්ෂය යටතේ පළාත් පාලන ජංගම සේවය සඳහා වෙන් කර ඇති රු:ලක්ෂ 06 මුදලින් පළමු කාර්තුවේ ජංගම සේවය සඳහා ඇස්තමේන්තු කර ඇති රු:92000.00 ක මුදල ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 වර්ෂයේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් අනුමත කරනු ලැබූ අයවැය යෝජනාවට අනුව 605 – 9 - ඃ ශීර්ෂය යටතේ පළාත් පාලන ජංගම සේවය සඳහා වෙන් කර ඇති රු:ලක්ෂ 06 මුදලින් පළමු කාර්තුවේ ජංගම සේවය සඳහා ඇස්තමේන්තු කර ඇති රු:92000.00 ක මුදල ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව කඩියන්ලෙන මහජන සෞඛ්‍ය පරික්ෂක ක්ෂේත්‍රය ආශ්‍රිතව 1980 අංක 26 දරණ ආහාර පනත අනුව නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය සඳහා පනවා ඇති නඩුව දැනට ඉදිරි විභාග කටයුතු සඳහා නිර්දේශව ඇති බැවින් ඒ සඳහා නීතිඥ මහතෙකුගේ සම්පත්දායකත්වය ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර එකී ඉල්ලීම අනුව කටයුතු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 සමග කියවිය යුතු වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව සභාව විසින් සේවා හා පහසුකම් සපයන පහත සේවාවන් විධිමත් ලෙස නියාමනය කර පවත්වාගෙන යාම සඳහා පහත අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

01. ගලබඩ දියඇල්ල අතුරු ව්‍යවස්ථාව
02. ප්‍රාදේශීය සභාවේ ඉහළ මහල සඳහා අතුරු ව්‍යවස්ථාව
03. කලුගල් ව්‍යාපෘතිය සඳහා අතුරු ව්‍යවස්ථාව

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත අතුරු ව්‍යවස්ථා සකස් කර එහි කෙටුම්පත් ඊළඟ මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

05 - 08 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
2022 වර්ෂයේ මා හට වෙන් වන ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන අරමුදලින් පහත සඳහන් සංවර්ධන යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර එහි සංවර්ධන කාර්යය ඉටු කරනු ලබන සමිතිය වශයෙන් විහාරස්ථාන දායක සභාව නම් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථානයේ විහාර මළුවේ ඉන්ටර්ලොක් කැටගල් ඇල්ලීම සඳහා රු:ලක්ෂයක මුදලක් වෙන් කිරීම.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
2022 වර්ෂයේ මා හට වෙන් වන ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන අරමුදලින් පහත සඳහන් සංවර්ධන යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර එහි සංවර්ධන කාර්යය ඉටු කරනු ලබන සමිතිය වශයෙන් වරකාව ග්‍රාම සංවර්ධන සමිතිය නම් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- වරකාව ගම්මහ වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය සඳහා රු:50,000.00 මුදලක් වෙන් කිරීම.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 10 ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
2022 වර්ෂයේ මා හට වෙන් වන ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන අරමුදලින් පහත සඳහන් සංවර්ධන යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරන අතර එහි සංවර්ධන කාර්යය ඉටු කරනු ලබන සමිතිය වශයෙන් වරකාව ග්‍රාම සංවර්ධන සමිතිය නම් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- ගොන්දෙන්නාව තැපැල්හල මාර්ගයේ ඉහළ තුංමං හන්දිය අසලින් ප්‍රියන්ත ජයසුන්දර මහතාගේ නිවස දෙසට පිවිසෙන මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීම සඳහා

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
රඹුක්පිටිය පැරණි ප්‍රාදේශීය සභා කාර්යාලය පිහිටි ස්ථානයේ සංචාරක සුවපහසු සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා සභා අනුමැතියක් ලබාගෙන ඇති අතර පහත සඳහන් කරුණු සඳහාද සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

01.දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය පහසුකම් ලබා ගැනීම හා එහි ඉදිරි කටයුතු සඳහා පහත සඳහන් කමිටුව පත් කිරිම.

- ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
- ලේකම් කේ.ප්‍රියංකා චාන්දනී මිය
- ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරි ඩබ්.එස්.පී සමරකෝන් මිය
- පරිසර නිලධාරි දිල්රුක් දිසානායක මයා
- සංවර්ධන නිලධාරි උමයංග හේරත් මයා
- හිටපු වැඩ අධිකාරි මහතා

<u>ගරු ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
වර්තමානයේ ඉන්ධන මිල ඉහළ යාම හා නඩත්තු වියදම් වැඩිවීම සමග මෙම මිලට ජේසීබී යන්ත්‍රය කුලියට ලබා දීම තුළින් සභාවට ආදායම අඩුවන හෙයින් එම ගාස්තුව පහත පරිදි සංශෝධනය කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

| | |
|---|---|
| 01. ජේසීබී යන්ත්‍රය කුලියට ලබා දීම | - රු: 3500.00 |
| 02. රියදුරු සඳහා යන්ත්‍ර පැයක වැටුප | - රු: 400.00 |
| 03. සභා කටයුතු හා නගර සභා කසල ව්‍යාපෘතිය සඳහා | - රු: 3000.00 |

<u>ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
මෙම දිනවල පවතින අධික වියළි කාලගුණය මත සභාව මගින් ජලය ලබා දෙන ප්‍රදේශ සඳහා නල මාර්ගයෙන් ජලය බෙදා හැරීම ඉතා දුෂ්කර වි ඇත.ජලය බෙදා හැරීම සඳහා ජල මූලාශ්‍ර වලද ජලය හිඟ වී ඇත.එම නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් මුදල් ගෙවා ජල බවුසරය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
බවුසර් එක අරන් කොහොමද අපි වතුර දෙන්නේ.අවශ්‍යතාවයක් උනොත් අපිට බවුසර් එකක් ගන්න පුලුවන් නේද?ඒකට කීයක් අය කරනවද?

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පොදුවේ දෙන්නේ මන්ත්‍රීතුමා.ගෝනාවලපතන,පත්තුනුපිටිය,ඉඹුල්පිටිය යන පැතිවලට තමයි ලොකුම ගැටලුව වෙලා තියෙන්නේ.බවුසරයකට අපි 3000.00 ගන්නවා.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සදහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව දෙකිද හොරේහින්න සුසාන භූමිය පිහිටි ඉඩම මැනුම් කටයුතු සිදු කර ගෙවිය යුතු මිනින්දෝරු ගාස්තුව ගෙවන ලෙසට දැනුම් දී ඇති බැවින් ඒ අනුව එම මිනින්දෝරු ගාස්තුව වන රු:10800.00 මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව අදාල මිනින්දෝරු ගාස්තු ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු එම්.ජී සුමනනන්ද මහතා විසින් එම මහතාගේ සේවා කාලය 2022.01.31 දිනෙන් අවසන් වන හෙයින් සේවය කරන ලද කාලය සදහා වැටුප් ලබා දෙන ලෙසත් සේවා කාලය තවත් වසරකින් සේවා කාලය දිර්ඝ කර දෙන ලෙසත් ඉල්ලා ඇති අතර ඔහු විසින් සේවය කරන කාලය සදහා තවමත් අනුමැතිය ලැබී නොමැති බැවින් වැටුප් ගෙවීම එතෙක් සිදු නොකිරිමටත් සේවා කාලය දීර්ඝ කිරිම සදහා අනුමැතියට යොමු කිරිම සුදුසු බවටත් ඒකමතිකව තීරණය කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.තාක්ෂණ නිලධාරියෙකු නැතිකම නිසා අපිත් ලොකු ගැටලුවකට මැදි වෙලා ඉන්නේ.අපි තාක්ෂණ නිලධාරියෙකුගේ අවශ්‍යතාවය කියලා ඉල්ලීමක් කරමු.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි වැඩ බලන්න ආවට බිල් වලට අත්සන් කරන්න බැරි නිසා ගැටලුවක් තියෙනවා.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තිරණය කරන ලදී.

05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කම්කරු ආර්.පී තෝමස් මහතා විසින් යොමු කර ඇති ලිපිය අනුව ඇල්ලවත්ත අමුණ අවහිර වන සේ වැටී ඇති ඇල්බීසියා කඳ ඉවත් කර දෙන මෙන් කරන ලද ඉල්ලීමක් කරලා තියෙනවා.එම ඇල්බීසියා කඳ ඉතා විශාල වන අතර එය ඉවත් කර ප්‍රවාහනය කිරිමේද හැකියාවක් නෑ.එම නිසා එම කඳ කපා ඉවත් කිරිම සදහා මිල ගණන් කැදවා ඒ අනුව එම කඳ ඉවත් කිරිමට කටයුතු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව ඇල්බීසියා කඳ ඉවත් කිරිම සදහා මිල ගණන් කැදවා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

සභාව සතු 6 කණුව ඉඩමෙන් කොටසක් ආදර්ශ තේ වගාවක් සඳහා බදු දීම හා ඒ සම්බන්ධව සකස් කරන ලද ගිවිසුම අනුව එකී ගිවිසුමේ 18 වගන්තිය පහත පරිදි සංශෝධනය කළ යුතු බව මම යෝජනා කරමි.
"ආදර්ශ තේ වගාවක් වන හෙයින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය.ඔවුන් පුහුණු කිරිමට අදාල භෞතික පහසුකම් පළමු පාර්ශවයෙන් ලබා දෙන අතර එම වැඩමුළු සහභාගීවන්නන්ට අවශ්‍ය සංග්‍රහ වියදම් කුඩා තේ වතු සමිතිය විසින් දැරිය යුතුය"

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 18 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
සභාව සතු ගැසට් නොකරන ලද කාපට් මාර්ග විස්තර පහත පරිදි ඉදිරිපත් කරන අතර එම මාර්ග ගැසට් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

01. නව ශාන්ත ජනපදයේ ආරම්භයේ සිට නාගස්තැන්න මාර්ගය
02. කෝප්සිටි ගාර්ඩින් පාර

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
රටේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ පුස්තකාලයේ ඡායා පිටපත් කරදීමේ ගාස්තු පහත සඳහන් පරිදි සංශෝධන කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.
A4 තනිපිට ඡායා පිටපත් පමණක් රු:5.00 වශයෙන් පැවති මිල රු:7.00 දක්වා සංශෝධනය කරන අතර අනෙක් ගාස්තු ඒ ආකාරයෙන්ම පැවතීම.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>05 - 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
කටුකිතුල,ගෝනාවලපතන,නාවලපිටිය යන ලිපිනයේ පදිංචි ඩී.ඒ සුදුබණ්ඩාර මහතා විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව කටුකිතුල ප්‍රධාන මාර්ගයේ සිට සුදුබණ්ඩාර මහතාගේ නිවස අසලින් යන කෘෂි මාර්ගය සංවර්ධනය කිරිම යටතේ එම මාර්ගය සංවර්ධනය කිරිම සඳහා මාගේ සභා අරමුදලින් රු:50000.00 මුදලක් යෙදවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව උක්ත මාර්ගය සංවර්ධනය කිරිම සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 21 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
හැරන්ඩල් ඒ කොටසේ ජනතාව විසින් සභාව වෙත යොමු කර ඇති ලිපිය අනුව එම ජනතාවට නාගස්තැන්න මාර්ගයට පිවිසීමේදී මාර්ගයක් නොමැති වීමෙන් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී ඇති බැවින් පවතින අඩි පාර පුළුල් කර බෝක්කුවක් සකස් කර දෙන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා.ඒ අනුව එම අඩි පාර සභාවේ ජේසීබී යන්ත්‍රය මගින් කපා පුළුල් කර දී බෝක්කුවක් සකස් කර දීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 22 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
සුහද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ පෙර පාසල් පාලිකාව විසින් දෙමළ භාෂාවෙන්ද පුහුණු වැඩසටහන් පවත්වන ලෙස සභාවෙන් ඉල්ලීමක් කර තිබෙනවා.ඒ අනුව සභාව විසින් ඉදිරියට පවත්වනු ලබන පුහුණු වැඩසටහන් වලදී මේ පිළිබඳ අවධානය යොමු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 22 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයට අදාලව ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘති අතරින් පළවෙනි කාර්තුව සඳහා ක්‍රියාත්මක කිරිමට අනුමත කරන ලද යෝජනා සඳහා එවා ඇති ඇස්තමේන්තු අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරිම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා ප.ව 1.12 සභා ගර්භයෙන් පිටව යන ලදී.

05 - 23 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කාර්මික සේවා කමිටුවේ නිර්දේශය අනුව හයිඩ්‍රි විද්‍යාලය අසල පාසලක් ඉදිරියෙන් යන පුවරුව සවි කිරිම හා මැදගහවතුර මාර්ගය නම් කිරිම සඳහා පුවරුවක් ගැසීම යන කරුණු සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවටත් කාර්මික සේවා කමිටු නිර්දේශය අනුව හයිඩ්‍රි පාලම කඩා ඉවත් කිරිම සඳහා තාක්ෂණ නිලධාරි මගින් වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවටත් එසේම සභාව මගින් පවත්වා ගෙන යනු ලබන ජංගම පුස්තකාල සඳහා නාම පුවරු සකස් කර ප්‍රදර්ශනය කිරිමත් කඩියන්ලෙන වෙස්ට්හෝල් හරහා හයිඩ්‍රි මාර්ගය නම් කිරිම සඳහා පුවරුවක් සකස් කිරිම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම.**</u>

06 - 01 මුදල් කාරක සභාව - 2022.03.14
06 - 02 නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව - 2022.03.10
06 - 03 කාර්මික සේවා කාරක සභාව - 2022.03.10
06 - 04 පරිසර හා පොදු පහසුකම් කා.ස - 2022.03.10
06 - 05 ගැටුම් සමථකරණ කාරක සභාව - 2022.03.10
06 - 06 පුස්තකාල උපදේශක කාරක සභාව - 2022.03.02

<u>07. **බැංකු සැසඳුම් ප්‍රකාශය,අභ්‍යන්තර විගණන වාර්තාව,ලැබීම් සාරාංශය,ගෙවීම් සාරාංශය,ගෙවීම් වාර්තාව,පුස්තකාල ප්‍රගතිය,ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම**</u>

- 2022.02.01 දින සිට 2022.02.28 දක්වා වවුචර් අංක 73 සිට 218 (1) දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

ගිණුම් අංකය - 053100164889286

මාසය - 2022 පෙබරවාරි

| | | | |
|---|---|---|---|
| 2022.02.01 දිනට මුදල් පොතේ ශේෂය | රු: | 9,862,154.00 | |
| එකතු කළා පෙබරවාරි මස මුළු ලැබීම් | රු: | 11,096,857.76 | |
| අඩු කළා පෙබරවාරි මස මුළු ගෙවීම් | රු: | 8,203,905.50 | |
| 2022.02.28 දිනට මුදල් පොතේ ශේෂය | | | රු: 12,755,106.26 |

<u>එකතු කළා</u>

| | | | |
|---|---|---|---|
| නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් | රු: | 1,658,085.61 | |
| | | | <u>රු: 1,658,085.61</u> |
| | | | 14,413,191.87 |

<u>අඩු කළා</u>

| | | | |
|---|---|---|---|
| බැංකු ගාස්තු | රු | 108.00 | |
| අත ඉතිරි මුදල් | රු: | 81,064.25 | |
| තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | රු: | 2,000.00 | |
| | | | <u>රු: 83,172.25</u> |

2022.02.28 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය <u>**රු:14,330,019.62**</u>

- 2022 පෙබරවාරි මස ගෙවීම් සාරාංශය

| විස්තරය | මුදල (රු) |
|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,256,721.50 |
| 02. ගමන් වියදම් | 66,685.00 |
| 03. සැලසුම් හා උපකරණ | 307,121.42 |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 284,825.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 247,162.33 |

| | |
|---|---|
| 06. පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 28,093.51 |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 50,092.08 |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 11,160.59 |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | **4,251,861.43** |
| 09. ප්‍රාග්ධන වැය | 800.00 |
| 10. ණය ආපසු ගෙවීම් | 186,833.50 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **187,633.50** |
| **පුන:වැය හා ප්‍රාග්:වැය මුළු එකතුව** | **4,439,494.93** |
| විවිධ ණය හිමියන් | 1,088,370.26 |
| කර්:ණය හිමියන් (309-3-1) | 11,888.60 |
| කර්:ණය හිමියන් (309-3-111) | 1,387,463.73 |
| කර්:ණය හිමියන් (304-5) | - |
| 10% කර්මාන්ත තැම්පත් | 193,845.31 |
| විවිධ තැම්පත් | 1,113,666.54 |
| මුද්දර තැම්පත් | - |
| දේපල ණය | 9,599.80 |
| සේවක ණය | 108,342.00 |
| අත්තිකාරම් | 12,000.00 |
| සමුච්චිත අරමුදල | - |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 16,500.00 |
| ජල ගබඩා අත්තිකාරම් | - |
| අගරු චෙක්පත් | - |
| කර්:ණය ගැතියන් | |
| **එකතුව** | 4,048,676.24 |
| **2022.02.28 දක්වා මුළු ගෙවීම් එකතුව** | **8,488,171.17** |

- 2022 පෙබරවාරි මස ලැබීම් සාරාංශය

| • අය විෂයය නාමයන් | මුදල (රු) |
|---|---|
| 10 වරිපනම් හා බදු | 404,639.97 |
| 20 කුලී | 110,388.80 |
| 30 බලපත්‍ර ගාස්තු | 160,000.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 299,843.77 |
| 50 වරෙන්තු ගාස්තු | 3,857.86 |
| 60 වෙනත් ආදායම් | 270,342.26 |
| 70 වෙනත් ආධාර | 3,970,152.76 |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | 5,219,225.42 |
| ජල ණය ගැතියෝ | 500.00 |

| | |
|---|---|
| ජල තැම්පත් | 4,500.00 |
| මුද්දර | 15,900.00 |
| විවිධ තැම්පත් | 296,675.85 |
| සේවක ණය | 263,985.00 |
| කර්මාන්ත තැම්පත් | 63,782.57 |
| දේපල ණය | 9,599.80 |
| විවිධ ණය ගැතියෝ | - |
| අත්තිකාරම් පියවීම | 27,360.42 |
| රු 25 මුද්දර | 1,650.00 |
| සැපයුම් හා උපකරණ | 2.000.00 |
| කර්මාන්ත ණය ගැතියෝ | 5,475,944.37 |
| වෙනත් ලැබීම් | 6,161,898.01 |
| 2022.02.28 දක්වා මුළු ලැබීම් | **11,381,123.43** |

- 2022 පෙබරවාරි මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 08

02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 05

03. පොත් බැහැර දීම - 1057

04. ව්‍යාප්ත සේවා -

- ජංගම පුස්තකාල සේවය ආරම්භ කිරිම - 2022/02/14 දින අළුත්ගම සියපත්පවුර ළමා සමාජය හා මාපාකන්ද දැහැමි පෙරපාසල

05. රැස්කළ ආදායම(පුස්තකාල)- 510.00

(නැණසල) - 2590.00

**08.ටෙන්ඩර් මණ්ඩලය**

08 - 01 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව සඳහා පොදු 35 වවුචර්පත් 1000 මුද්‍රණය කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| Leo Printers,Gampola | Rajah Press,Nawalapitiya | A.M.P Print Shop (Pvt)Ltd,Gampola | නව ළහිරු මුද්‍රණාලය,ගම්පොල |
|---|---|---|---|
| 4000.00 | 4200.00 | 4400.00 | 4500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Leo Printers,Gampola”යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 02 පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය LED වීථි පහන් ආධාරකය සහිත 150W මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| මහවැලි හාඩ්වෙයාර්, නාවලපිටිය | ඊගල් ඉලෙක්ට්‍රිකල්ස්, මහනුවර | ඇට්ලස් ඉලෙක්ට්‍රිකල්ස්, මහනුවර | යූ.කේ ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 11 | NMI Infra (PVT)Ltd | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ11 |
|---|---|---|---|---|---|
| 14950.00 | 15600.00 | 15500.00 | 10950.00 | 25375.00 | 16500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා මෙම මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර තීරණයක් ගෙන මිලදී ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 03 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ජංගම සේවා සඳහා දහවල් කෑම ලබා දීමට මිල ගණන් කැඳවීම.

| විස්තරය | මනෝජ් ප්‍රඩක්ට්,නාවලපිටිය | දිලාන් ෆෘඩ්ස්,නාවලපිටිය | Mihara Restaurant & Caterers,Nawalapitiya |
|---|---|---|---|
| කුකුල් මස් කෑම | 330.00 | 320.00 | 300.00 |
| මාළු කෑම | 265.00 | 260.00 | 260.00 |
| එළවළු කෑම | 200.00 | 200.00 | 210.00 |
| | | | |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "Mihara Restaurant & Caterers,Nawalapitiya"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 04 සභාව සතු ජේසීබී යන්ත්‍රය සඳහා ග්‍රීස් බකට් එකක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| තරංග හාඩ්වෙයාර්,නාවලපිටිය | සුරංග මෝටර්ස්,නාවලපිටිය | විතාන මෝටර්ස්,නාවලපිටිය |
|---|---|---|
| 11000.00 | 17500.00 | 16900.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "තරංග හාඩ්වෙයාර්,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 05 සභාව සතු RD 6662 ට්‍රැක්ටරය සඳහා වීල් බ්‍රෂ් හා ජැක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| | හේමාල් මෝටර්ස්,නාවලපිටිය | විතාන මෝටර්ස්,නාවලපිටිය | සුරංග මෝටර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| වීල් බ්‍රෂ් | 1900.00 | 1750.00 | 1850.00 |
| ජැක් | 6200.00 | 5900.00 | 6000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් සපයා ඇති "විතාන මෝටර්ස්,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 06 සභාව සතු QR 9559 ත්‍රීරෝද රථය සඳහා ටයර් හා රිම් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| | සුරංග මෝටර්ස්,නාවලපිටිය | විතාන මෝටර්ස්,නාවලපිටිය | හේමාල් මෝටර්ස්,නාවලපිටිය |
|---|---|---|---|
| ටයර් | 4800.00 | 3950.00 | 4850.00 |
| රිම් | 3900.00 | 2950.00 | 3000.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් සපයා ඇති "විතාන මෝටර්ස්,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 – 07 සභාව සතු RD 6662 ට්‍රැක්ටරය සඳහා ටයර් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| කොත්මලේ ටයර් හවුස්,නාවලපිටිය | ස්ටෙනෝර් ටයර් හවුස් |
|---|---|
| 18750.00 | 18950.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් සපයා ඇති "කොත්මලේ ටයර් හවුස්,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 08 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ උඩු මහලේ වායුසමීකරණ පරිශ්‍රය සකස් කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| හෙලිනි එන්ටර්ප්‍රයිසස්,නාවලපිටිය | ඩී.වී මර්වින්,කටුගස්තොට | ඉන්දික ඇළුමිනියම් කාර්මිකයෝ,නාවලපිටිය |
|---|---|---|
| 186250.00 | 196000.00 | 192500.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “හෙලිනි එන්ටර්ප්‍රයිසස්,නාවලපිටිය”යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 09 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය සඳහා කබඩ් මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්,නාවලපිටිය | ජයන්ති ටිම්බර් ඩිපොට්,නාවලපිටිය |
|---|---|---|
| 31500.00 | 32000.00 | 32500.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය”යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 10 කාර්යාලයේ ඉහළ මහල සඳහා රැස්වීම් ශාලා පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| ජයන්ති ටිම්බර් ඩිපොට්,නාවලපිටිය | මිත්‍රානි ඩිස්ට්‍රිබියුටර්ස්,නාවලපිටිය | සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය |
|---|---|---|
| 15000.00 | 14800.00 | 14250.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “සමගි ෆර්නිචර්ස්,නාවලපිටිය යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 11 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා අවශ්‍ය කැනපි ටෙන්ට් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| එකෝ ඉවෙන්ට් ඇඩ්වෙන්චර්,නුගේගොඩ | ටෙන්ට් මාස්ටර්,මොරටුව | කැම්පින්ග් ටෙන්ට්,පිළියන්දල |
|---|---|---|
| 43500.00 | 36000.00 | 42000.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “ටෙන්ට් මාස්ටර්,මොරටුව”යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 12 අඩි 3*2 නාම පුවරුවක් සැකසීම හා සවි කිරිම සඳහා මිල ගණන් කැදවීම.

| ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය | කුමාර අයන් වර්ක්ස්,ගිනිගත්හේන | සම්පත් වැල්ඩින්,දෙකිද පාර,නාවලපිටිය |
|---|---|---|
| 19500.00 | 22000.00 | 20500.00 |

මේ පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “ලක් රූ,රඹුක්පිටිය,නාවලපිටිය”යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 13 කාර්යාලයේ ඉහළ මහල සඳහා ශබ්ද විකාශන උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවීම.

| විස්තරය | දිනපාල සුපර් සෙන්ටර්,මහනුවර | සකුණ හෝල්ඩින්ග්ස්,ගැටඹේ, මහනුවර | KAD Trading (PVT) Limited,Kandy |
|---|---|---|---|
| TOA MIXER POWER AMP | 214250.00 | 214890.00 | 215580.00 |
| TOA WALL SPEAKER | 231900.00 | 234000.00 | 233400.00 |
| GOOSNECK MICROPHONE | 46200.00 | 60550.00 | 46550.00 |
| GOOSNECK MICROPHONE | 46200.00 | 46900.00 | 46550.00 |
| FM HANDHELD MICROPHONE | 59900.00 | 46900.00 | 61200.00 |
| MDF PODIUM TABLE | 45500.00 | 46000.00 | 47250.00 |
| ORIGINAL MICROPHONE WIRE | 16500.00 | 10990.00 | 21000.00 |
| ORIGINAL MALE/FEMALE JACK | 5100.00 | 5520.00 | 5940.00 |
| HARDWARE ITEM | 49875.00 | 50500.00 | 50550.00 |
| TWO PAIR WIRE – PARALLEL TWIN | 21700.00 | 39500.00 | 22340.00 |
| TESTING AND COMMISSION CHARGES | 18500.00 | 19850.00 | 20000.00 |
| TRANSPORT/LABOUR CHARGES | 26500.00 | 27100.00 | 27250.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 14 සභා සඳහා අවශ්‍යා ගලබඩ ටිකට්පත් 5000 ක් මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම.

| මිඩ්ලන්ඩ් ප්‍රින්ටර්ස්,නාවලපිටිය | සොලිඩ් නෙට්,නාවලපිටිය | රාජා මුද්‍රණාලය,නාවලපිටිය |
|---|---|---|
| 21500.00 | 21000.00 | 19500.00 |

මේ පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති "රාජා මුද්‍රණාලය,නාවලපිටිය"යන ආයතනයෙන් අදාල කාර්යය ඉටු කර ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

**<u>09. වෙනත් කරුණු</u>**

සාකච්ඡා කිරිමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 2.00 පමණ අවසන් කරන ලදී.

ලේකම්,
පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව

සභාපති,
පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව

<u>ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා</u>

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පුලුවන් ඉඩම් සින්නක්කර උනත් විකුණන්න.එයාලා බලන්නේ රජයේ ආයතනයකට උනත් මේක පවරන්නේ නැතුව විකුණන්න.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

කසල ප්‍රතිචක්‍රීකරණයට ඉඩමක් ගන්න බැරිද සභාපතිතුමා.සතියකට එක දවසක් හරි වාහනේ යවන්න පුලුවන්.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

දැනට අපිට කසල වලට ලොකු ගැටලුවක් ඇති වෙලා නෑ.කසල එකතු කරනවානම් බද්දක් අය කරන්න වෙනවා.මේ වේලාවේ ජනතාවගෙන් බදු අය කරන්නත් බෑ.නගර සභාවේ කසල අංගනයට යාබද ඉඩමක් ඉල්ලලා ලිපියක් යවන්න පුලුවන්.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
යෝජනාවක් විධියට ආවා සොහොන් ගෙයක් හදන එක ගැන ගරු සභාපතිතුමා.ඒ ගැනත් අවධානය යොමු කරමු.ආදාහනාගාරයක් හදන්න ඉඩමක් කියලා ඉල්ලීමක් කරමු.හයින්ෆෝඩ් හන්දිය ළගත් කසල දැමීම තහනම් කියලා තිබුණ පුවරුව ගලවලා තිබුණා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
මුස්ලිම් කනත්තට යාබද අක්කර 1 ½ ඉඩමක් තියෙනවා.එතනට යන්න පාරකුත් තියෙනවා.වත්තේ අයට භූමිදාන කරන්න වෙනම කොටසක් තියෙනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රධාන පාරක් අයිනේ වගේ තිබ්බොත් ලොකු ආදායමක් ගන්න පුලුවන් නේද?මිලදී ගැනීමක් කරන්න බලමු.උලපනේ ගඩොල් බෝක්කුව ළඟ ගල් තියලා තිබුණා.කුණු දැමීම පාලනයකුත් වෙලා තියෙනවා ඒකෙන්.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
ශ්‍රී පාදේ යන අයට කන්න බොන්න තැනක් තමයි නැති වෙන්නේ.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
ආදායමක් ගන්න පුලුවන් විධියට ඒ තැන හැදුවා නම් හරි.අපේම අයට ව්‍යාපාරයකුත් කරන්න පුලුවන්.දැන් කුණු දාන එක නම් ටිකක් අඩු වෙලා.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා
විග්ටන් පහළ කොටසේ ප්‍රජා ශාලාවේ ජංගම පුස්තකාලයක් ආරම්භ කරන්න කටයුතු කරමු සභාපතිතුමා.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
වරකාව පන්සල ළඟ දැන්වීම් පුවරුව ගලවලා දාලා.තෝමස් පල්ලේගමට ජලය සපයන කාලෙත් හොදට වැඩ කළා.දැන් දෙකිද පැත්තෙත් හොදට වැඩ කරනවා කියලා ආරංචියි.ඒ වගේම කුලේන්දිරම් හෝල්ගමට වතුර ලබා දෙනකොට වැල් එක වහලා ගියාම රජයේ නිලධාරියෙක් ඉන්නවා එයා ආයේ ගිහින් වැල් එක ඇරලා එයාට විතරක් වතුර ගන්නවා.සමහර තැන්වල එක ගෙදරටම වැල් කීපයක් දාලා තියෙනවා.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
ඉගුරුඔය දිය ඇල්ල සම්බන්ධ ගැටලුවට අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇවිත් තියෙනවා.එයාලට අයිති පර්චස් 24යි.ඕන වෙලාවක එයාලා දෙන්නම් කියලා කිව්වා.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
NVQ සහතික ලබා ගැනීමේදී පාසල් හැර යන දරුවන් මේ සම්බන්ධයෙන් නිසි දැනුවත් බවක් නෑ.ඒ නිසා එයාලා දැනුවත් කිරිමේ වැඩසටහනක් කරමු.මාර්තු 30 හා 31 තමයි දැනුවත් කිරිමේ කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ.ඒ වගේම හාල් මිල දිනෙන් දින ඉහළ යනවා.වෙළඳපොලට ඕනි විධියට තමයි මිල තීරණය කරන්නේ.සභාව විධියට මේ සම්බන්ධයෙන් මොනයම් හෝ මැදිහත් වීමක් කරන්න පුලුවන් නම් හොදයි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
රටේ ඩීසල් හා පෙට්‍රල් ඕනි තරම් තියනවා.පිරවුම්හලේ සේවකයාට මුදල් දුන්නොත් ගන්න පුලුවන්.ඇමතිතුමත් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න ඕනි.

ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
සභාවේ කමිටු අලුතින් පත් කරමු සභාපතිතුමා.සභාවේ සියලු දෙනා නියෝජනය වන විධියට.අපි අසුන් අරගෙන ඉන්න විධියට ජේෂ්ඨත්වය අනුවද මේ වාඩි වෙලා ඉන්නේ? ඒ වගේම මගේ අත්තම්මා නැති උනා.කොරෝනා පොසිටිව් උන නිසා දුන්නේ නෑ.මගේ විශේෂ ස්තුතිය මේ වෙලාවේ පළ කරනවා නාවලපිටිය නගර සභාවේ සභාපතිතුමාට.එතුමාට දැනුම්

දෙන්න මං මෙහෙම සභාවේ කථා කරා කියලා.අපේ හාමුදුරුවන්ට සිදු උන කරදරය සම්බන්ධයෙන් මාගේ කනගාටුව පළ කරනවා.ඒ වගේම අයවැය සම්බන්ධව ඇමතිතුමා යම් ප්‍රකාශයක් කරලා තියෙනවා අයවැයට එක්සත් ජනතා නිදහස් සන්ධානය ජන්දේ දුන්නේ නැති උනාට අපි පැරදුනේ නෑ කියලා.අපිට කිසිම දෙයක් සභාවෙන් සිදු උනේ නැති නිසා තමයි අපි විරුද්ධ උනේ.

<u>ගරු මන්ත්‍රී ජී.කේ.පී ෆොන්සේකා මිය</u>
පස්බාගේ කෝරළේ බල ප්‍රදේශයේ පෙර පාසල් සම්බන්ධව සභාවෙන් මැදිහත් වෙන්න පුලුවන් ආකාරය ගැන පැහැදිලි කරගන්න ඕනි.මං ලේකම්තුමියත් එක්කත් කථා කරා පෙර පාසල් සම්බන්ධ ගැටලුවක් ගැන.මං පෙර පාසල් සම්බන්ධ ලේකම්තුමියත් එක්කත් කථා කරා.නමුත් එතුමිය කිව්ව කරුණු වලට හාත්පසින්ම වෙනස් දේවල් තමයි කොට්ඨාසයේ පෙර පාසල් වල වෙන්නේ.එක නීතියක් හැමෝටම තියෙන්න ඕනි.ගල්පොත්තවල පෙර පාසල් දෙකක් තියෙනවා.එකක් ක්‍රමානුකූලව කරගෙන යනවා.නමුත් අනිත් පෙර පාසල කරන කෙනාට සුදුසුකම් නෑ කියලා ලියාපදිංචි කරන්න බෑ කියලා.පෙර පාසල් පාලිකාවන් සමහර අයට කියන සුදුසුකම් නෑ.මාපාකන්ද තියෙන පෙර පාසල් තුනම එක් ස්ථානයකට ගෙනල්ලා කරගෙන යන්න දෙන්න කියලා තමයි පාලිකාව කියන්නේ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පෙර පාසල් වලට නීත්‍යානුකූල මැදිහත් වීමක් වෙන්න බෑ.සුදුසුකම් නැති අයට නම් පෙර පාසල් කරන්නම දෙන්න එපා.එයාට සුදුසුකම් සපුරා ගන්න තෙක් සුදුසුකම් සහිත කෙනෙක් අනුයුක්ත කරගන්න කියන්න.